# ශ්‍රී ලංකාවේ විදේශ සංක්‍රමණය සහ ආදායම



M.B.ඉරෝෂිකා බණ්ඩාර

මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය

## ශ්‍රී ලංකාවේ විදේශ සංක්‍රමණය සහ ආදායම

සෑම පිරිමි සංක්‍රමණිකයෙකු සඳහාම එක් කාන්තා සංක්‍රමණිකයෙක් සිටින අතර, සංක්‍රමණිකයන් ලෝක ජනගහනයෙන් සියයට 3[1] කට වඩා වැඩිය. සංක්‍රමණයේ ඇගයුම් පිරිමි සහ ගැහැණුන් සඳහා වෙනස් වන අතර, ස්ත්‍රී පුරුෂ භාවය හා සම්බන්ධ අපේක්ෂාවන්, අන්තර්ක්‍රියා සහ බල ගතිකතාවයන් සංක්‍රමණ ක්‍රියාවලියේ සියලු අංශ කෙරෙහි බෙහෙවින් බලපායි. 1977 දී ශ්‍රී ලංකාව විවෘත වෙළඳපොල ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දුන් අතර එයට විදේශ රැකියා සඳහා පිටවීම සීමා කිරීම ලිහිල් විය. එතැන් සිට, ශ්‍රම සංක්‍රමණය සංවිධානාත්මකව කැපී පෙනේ. 1977 න් පසු ශ්‍රම සංක්‍රමණික ප්‍රවාහයන්ගෙන් බහුතරයක් සමන්විත වූයේ තාවකාලික සංක්‍රමණිකයන් වන අතර ඔවුන් කෙටි කාලයක් සඳහා විදේශයන්හි සේවය කිරීමට අදහස් කළ අතර ඔවුන්ගේ පවුල් ශ්‍රී ලංකාවේ රැඳී සිටියහ. ශ්‍රී ලංකාවෙන් ශ්‍රම සංක්‍රමණය පිළිබඳ මෙම කෙටිකාලීන දෘෂ්ටිය නිසා ප්‍රේෂණ රටේ විදේශ විනිමය ඉපැයීම් සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයයි. 1988 සිට 2007 දක්වා, ශ්‍රම සංක්‍රමණිකයන් අතර කාන්තාවන්ගේ සාමාන්‍ය කොටස 66% කි.මෑත වසරවලදී (2008-14) කාන්තාවන්ගේ සාමාන්‍ය කොටස 46% දක්වා අඩු විය. කාන්තා සංක්‍රමණිකයින්ගේ කොටස අඩුවුවද, ඔවුන්ගේ විශාලත්වය නියතව පැවතුනි. කාන්තා සංක්‍රමණිකයන් අතර ගෘහ සේවිකාවන් විශාලතම කොටස දරයි **. 2018 දී ගෘහ සේවිකාවන් කාන්තා පිටත්වීම්වලින් 31% ක් විය[2]**. මෙම කොටසෙහි දිගුකාලීන පහත වැටීමේ ප්‍රවණතාවයක් තිබියදීත්, නිරපේක්ෂ වශයෙන් ගත් කල, කාන්තාවන් තවමත් වසරකට පිටත්වීම් 100,000 කට වඩා වැඩිය. ඒ හා සමානව, ගෘහ සේවිකාවන් තවමත් සියලුම වෘත්තීන් අතර විශාල කොටසක් දරයි. සමස්තයක් වශයෙන්, ශ්‍රී ලාංකික සංක්‍රමණික කම්කරුවන්ගෙන් බහුතරයක් සංක්‍රමණික සේවකයින්ගේ නිපුණතා ව්‍යාප්තියේ රැකියා සඳහා සම්බන්ධ වී සිටිති.

රැකියා සඳහා දිනකට විදේශගත වීමේ සාමාන්‍ය 2017 වර්ෂයේ 581කි.රැකියා සඳහා සංක්‍රමණ වූවන්ගේ ප්‍රතිශතයක් ලෙස එය 14.7% කි.වත්මන් ආර්ථික ක්‍රමයේ ශ්‍රම සංචලනය සඳහා අන්තර්ජාතික ලෙස ප්‍රතිපත්තිමය ප්‍රතිපාදන හරහා නීත්‍යානුකූලකරණයක් 2030 සහශ්‍ර සංවර්ධන ඉලක්කයන්හි න්‍යාය පත්‍රය තුළට ශ්‍රමය සඳහා විදේශගත වීම;ශ්‍රම සංචලනයන් හි දායකත්වය පිළිබඳ ඉලක්කයන් සහ දර්ශකයන් ඇතුළත් කිරීම මගින් සිදු කර ඇත.

---

[1] ලෝක බැංකුව 2016
[2] මහ බැංකු වාර්තාව 2018

වගු 1: විදේශ සේවා නියුක්තිය

| ශීර්ෂය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| සේවා නියුක්තිය සඳහා විදේශගතවූවන් | 263,443 | 242,930 | 212,162 | 211,459 |
| පුරුෂ | 172,788 | 160,302 | 139,271 | 129,774 |
| ස්ත්‍රී | 90,655 | 82,628 | 72,891 | 81,685 |
| පුහුණුව අනුව සංක්‍රමිකයින් | | | | |
| වෘත්තීය නිලධාරීන් | 6,251 | 6,574 | 6,371 | 7,210 |
| මධ්‍යම තත්ත්වය | 6,951 | 8,235 | 7,124 | 7,748 |
| ලිපිකරු සහ ඒ ආශ්‍රිත | 12,501 | 10,864 | 9,265 | 10,021 |
| පුහුණු ශ්‍රමික | 81,682 | 76,559 | 68,993 | 67,053 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 4,847 | 3,930 | 3,295 | 2,770 |
| නුපුහුණු ශ්‍රමික | 77,985 | 71,641 | 61,057 | 51,719 |
| ගෘහ සේවිකා | 73,226 | 65,127 | 56,057 | 64,938 |

මූලාශ්‍රය මහ බැංකු වාර්තාව 2018

විදේශ රැකියා සඳහා පිටව ගිය කාන්තාවන් සංඛ්‍යාව ඉහළ ගියද, විදේශ රැකියා සඳහා පිටව ගිය මුළු සංඛ්‍යාව සුළු වශයෙන් පහළ ගියේය.

**ඒ අනුව 2017 වර්ෂයේදී 139,271ක් වූ විදේශ රැකියා සඳහා පිටව ගිය පුරුෂයන් සංඛ්‍යාව 2018 වසරේදී 129,774 ක් දක්වා සියයට 6.8කින් අඩුවීමක් දක්නට ලැබේ. 2018 වර්ෂයේදී විදේශ රැකියා සඳහා පිටව ගිය කාන්තාවන් සංඛ්‍යාව 2017 වසරට සාපේක්ෂව 72,891 සිට 81,685 දක්වා සියයට 12.3 කින් වැඩි වූ අතර ඒ සඳහා අවු:35-44 අතර වයස් කාණ්ඩයේ ගෘහ සේවිකා රැකියා සඳහා කාන්තා පිටව යෑම් වැඩිවීම ඉවහල් විය.2018 වසරේදී නුපුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා පිටව යෑම් සියයට 15.3 කින් අඩු වුවද නුපුහුණු සහ ගෘහ සේවිකා කාණ්ඩ තව දුරටත් විදේශ රැකියා සඳහා සමස්ත පිටව යෑම් වලින් 55.2ක් නියෝජනය කරයි.**

**ප්‍රස්තාර 1: ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංක්‍රමණික සේවා නියුක්තිය(%)**




මූලාශ්‍රය:ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය

ප්‍රස්තාර 1: අනුව 2017 වර්ෂයට වඩා පුරුෂ සංක්‍රමණික සේවා නියුක්තිය 2018 වර්ෂයේදී අඩුවීමක් දක්නට ලැබෙයි.**2017 වර්ෂයේදී 34.4% ක ප්‍රතිශත අගයක් ගත් ස්ත්‍රී සංක්‍රමණික සේවා නියුක්තිය 2018 වර්ෂයේදී 39% ක ඉහළ අගයක් ගනී.**

**ප්‍රස්තාර 2:විදේශ රැකියා සඳහා නික්මයාම -රටවල් අනුව 2016-2017**




මූලාශ්‍රය:ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන -2018

ප්‍රස්තාර 2 අනුව විදේශ රැකියා සඳහා නික්මයාම සමස්ත පිටව යැම් වලින් ප්‍රතිශතයක් ලෙස **88.2%** ක් පමණ වන මැදපෙරදිග කලාපයේ රැකියා සඳහා විදේශගතවීම් සම්බන්ධයෙන් ප්‍රමුඛ ස්ථානය ගන්නා අතර ගෘහ සේවිකාවන්ගෙන් **97.4%ක්** සහ නුපුහුණු ශ්‍රමිකයන්ගෙන් **78%ක්** මැදපෙරදිග රටවල සංකේන්ද්‍රනය වී ඇති අතර **පුරුෂ පක්ෂය විදේශ රටවලට සංක්‍රමණය වීම 85%ක් සහ කාන්තා පාර්ශවය විදේශ රටවලට සංක්‍රමණය වීම 93.3% ක් මැදපෙරදිග රටවල සංකේන්ද්‍රනය වී ඇත.**

**<u>ප්‍රස්තාර 3:නිපුණතා අනුව සංක්‍රමණික සේවා නියුක්තිය(%)</u>**




මූලාශ්‍රය:ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර 3 ට අනුව 2018 වර්ෂයේදී ගෘහ සේවිකාවන් ලෙස විගමනය වූ ප්‍රතිශතය 30.7% ක අගයක් ගන්නා අතර එය 2017 වර්ෂයට වඩා වැඩි අගයක් ගන්නා අතර **පුහුණු ශ්‍රමික ප්‍රතිශතය 2018 වර්ෂයේදී 31.7% ක අගයක් ගනියි.එය 2017 වර්ෂයට වඩා අඩු අගයක් ගනියි.**

**වගු 02: විදේශ සංක්‍රමණකයන්ගේ ප්‍රේෂණ**

| විදේශ සංක්‍රමණකයන්ගේ ප්‍රේෂණ (රු.මිලියන) | | |
|---|---|---|
| | 2017 | 2018 |
| මැදපෙරදිග | 565,642 | 582,719 |
| යුරෝපා සංගමය | 199,831 | 212,829 |
| ඈත පෙරදිග ආසියාව | 125,577 | 137,713 |
| අනෙකුත් යුරෝපා රටවල් | 50,231 | 50,077 |
| උතුරු ඇමෙරිකාව | 31,667 | 29,591 |
| ගිණිකොනදිග ආසියාව | 60,058 | 66,011 |
| ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය | 26,207 | 25,039 |
| දකුණු ආසියාව | 16,380 | 25,039 |
| දකුණු හා මධ්‍යම ඇමෙරිකාව | 7,644 | 5,691 |
| අනෙකුත් | 8,736 | 3,414 |
| එකතුව | 1,091,972 | 1,138,124 |

මූලාශ්‍රය: මහ බැංකු වාර්තාව 2018

වගු 02:අනුව විදේශ සංක්‍රමණිකයන්ගේ ප්‍රේෂණ වල වැඩි දායකත්වයක් දක්වා ඇත්තේ **මැදපෙරදිග සංක්‍රමණික සේවා නියුක්තිය තුළිනි**.2017 වර්ෂයට වඩා 2018 වර්ෂයේදී එහි වර්ධනයක් දක්නට ලැබෙයි.

## විදේශ සංක්‍රමණිකයන්ගේ ප්‍රේෂණ වැඩි කර ගැනීමට නම්

ලංකාවේ **විදේශ සංක්‍රමණය** ආර්ථිකයේ විදේශ විනිමය ඉපයීම් දෙවන ස්ථානය වෙයි. විරැකියා අනුපාතිකය අඩු කිරීම සහ ආදායම් ඉපයීම් මඟින් දිළිදුකම අඩු කිරීම සඳහා ඉටුකරන සැලකිය යුතු කාර්යභාරය සහ පෞද්ගලික ප්‍රේෂණ විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධාන මූලාශ්‍ර වලින් එකක් වන බැවින් විදේශ රැකියා ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි.විරැකියා අනුපාතිකය අඩුකිරීම සහ ආදායම් ඉපයීම් මඟින් දිළිදුකම අඩු කිරීම සඳහා ඉටු කරන සැලකිය යුතු කාර්යභාර්ය සහ පෞද්ගලික ප්‍රේෂණ විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධාන මූලාශ්‍ර වලින් එකක් වන බැවින් විදේශ රැකියා ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි.

නුපුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා පිටව යෑම අවම කිරීමට අර්ධ පුහුණු හා පුහුණු ශ්‍රම වෙළඳපොළ වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යොමු කළ යුතු අතර .විධිමත් පුහුණු ලබා දීම අනිවාර්ය විය යුතුයි.

ස්ත්‍රී පුරුෂ භාවය සහ සංක්‍රමණය අතර ප්‍රතිලාභ වැඩිදියුණු කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු විසඳීමට මූලිකත්වය දිය යුතු අතර .කාන්තාවන් විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීම තුළින් ඇතිවන සමාජ ගැටලු ,සමාජ පිරිවැය, ශ්‍රමය සූරා කෑම ගෙවීම් නොකිරීම,අඩුවෙන් ගෙවීම, ශාරිරික අපයෝජනය වැනි අවාසි සහගත තත්ත්වයන් අඩු කිරීමට ප්‍රබල අවධානයක් යොමු කළ යුතු වෙයි.

කාන්තා සංක්‍රමණිකයන්ගේ සුභ සාධනය ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්ති වලට කාන්තා සංක්‍රමණය අඩු කිරීමත් පුරුෂ සංක්‍රමණය ඊට සාපේක්ෂව ඉහළ නැංවීමක් කළ හැකිය.

සංක්‍රමණික පිටත්වීම් අතර කාන්තාවන්ගේ ප්‍රතිශතය අඩුවීමට බොහෝ දුරට හේතු වී ඇත්තේ පිරිමි ශ්‍රමිකයන්ගේ වැඩි වීමමිස නිරපේක්ෂ කාන්තා විගමනයේ සැලකිය යුතු අඩුවීමක් නොවන බව ද පැහැදිලිය.